ජයන්ත සම්බන්ධව සිටින දේශපාලන ව්‍යාපාරය තුළ ද ජයන්ත තුළ ද නැත්නම් තමන් තුළ ද යන්න විදුලට නොවැටහෙයි.

"සමාජ සංශෝධනයකට පෙරමුණ ගන්න ඕනෙ දේශපාලන ව්‍යාපාර නිදා ගෙන ඉන්නකොට මං වගේ පුංචි කලාකාරයෙක් ගලක් හරි ගහන්න උත්සාහ කරන එක වටින්නැද්ද..?" වාඩිවී සිටින ගමන්ම පුටුව පසුපසට තල්ලු කළ විදුල කකුලක් පිට කකුලක් දමා ගත්තේ ය. දිග කතාවකට ඒ ඉරියව්ව පහසු ය. මේසය හරහා හැකිතාක් විදුල දෙසට ළං වූ ජයන්ත රවා බැලුවේ ය.

"ඒ කතාව අපිට එල්ල කළ චෝදනාවක් නේද? අපි නිශ්ෂබ්ද නැහැ මහත්තයා.. ඒත් මේ වගේ සිල්ලර කාරණා අපේ ඇජෙන්ඩා එකේ නැහැ.. තේරුණා ද..?"

"මොකද්ද සිල්ලර කාරණෝ..?"

"වෙන මොකද්ද..? ලෙක්චරර් කෙනෙක් ශිෂ්‍යාවක් කාමරේට අරගෙන යන එක.. ඕක අද ඊයෙ අලුතින් වෙච්ච දෙයක් නෙවෙයිනෙ.. අපි යුනිවර්සිටියෙ ඉන්න කාලෙත් ඕක ඔහොමම වුණානෙ... විසිටින් ලෙක්චරර් කෙනෙක් හැටියට උඹත් ඒක දන්නවනෙ.. මේව ඒ ඒ අයගෙ පුද්ගලික කාරණා.."

වායුසමන යන්ත්‍රයක් ක්‍රියාත්මක වුවද විදුලට දැනුනේ මහත් අපහසුතාවකි. ඔහු කමිසයේ උඩ බොත්තමක් ගැලෙව්වේ සහනයක් ලැබේ යයි සිතා ය. ජයන්ත කතා කරන අවඥාසහගත ස්වරය ඔහුගේ සිත ගිණියම් කරයි.

"හැමදාම වුණා කියලා වරදක් හැමදාම පවතින්න ඕනෙද..?" විදුල හැඟීම් මැඩපවත්වාගන්නට වෙරදරමින් අසයි. "..මේ දේවල් වලට නැවතීමක් තියෙන්න ඕනෙ කියන එක පිළිගන්නැද්ද..? සදාචාරවත් විශ්ව විද්‍යාල පද්ධතියක් කියන්නෙ රටකට ආභරණයක් නෙමෙයි ද..? උඹල කතා කරන සමාජ සංශෝධනයෙදි ඒක වැදගත් කාරණාවක් වෙන්නෙ නැද්ද.. රටට අවශ්‍ය කරන බුද්ධිමතුන් බිහිකරන ආයතනවල පිරිසිදු බව උඹලට සිල්ලර කාරණයක් වෙන්නෙ කොහොම ද..?"

"දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි කැමතියි සමස්ථ සමාජයට ම දැනෙන දේ කරන්න.. උඹ ඔය සාකච්ඡා කරන කාරණෝ වැදගත් වෙන්නෙ මේ සමාජයේ ඉතා කුඩා අංශූ මාත්‍රයකට විතරයි.."

"බම්බුව.. මේ සමාජය මෙහෙයවන්නෙ බුද්ධිමතුන්.. ඒ බුද්ධිමතුන් බිහිවන ආයතන ජරාවට යනවා කියන්නෙ සමස්ථ සමාජයම ජරාවට යනවා කියන එකම තමයි.."

ජයන්ත කොක්හඬ ලා සිනා සුණේ ය.

"බුද්ධිමතුන්...? කොහෙද බං එහෙම අය ඉන්නෙ...? අද අපේ සමාජය මෙහෙයවන්නෙ බුද්ධිමතුන් නෙවෙයිනෙ විදුල .." ඔහු කියන්නේ ඇස්වල නැගුණ කඳුලු පිටි අල්ලෙන් පිසදා ගන්නා අතර ය. ".. බොහොම ඉස්සර කාලෙක එහෙම යුගයක් තිබුණා තමයි.. හැත්තෑ හතේ දි අපි ඒ යුගය හමාර කළානෙ.. අමතක වුණා ද..? අද සමාජය මෙහෙයවනු ලබන්නෙ අහවල් තැන සුරසැප විඳින දෙසියවිසිපහක් විසින්ය කියන එක අමතක කරන්න එපා.. උන්ගෙන් සියයට හැත්තෑ පහක්ම ඕ ලෙවල් වත් පාස් නොකළ ගොබ්බයො.. ඒත් දැකල නැද්ද අපේ උගත් පරපුරේ මහා පුරුක් ඒ ගොබ්බයන් ඉදිරියේ දෙකට නැවෙන හැටි..?"

"ඉතින් උඹ කියන්නෙ හැමදෙනාම ටෙලිනාට්‍යයක් දිහා බලා ඉන්නවා වගේ ඔහේ බකන්නිලාගෙන මේ නාඩගම දිහා බලාඉන්න ඕනෙ කියන එකද? උඹලගෙ දේශපාලන ව්‍යාපාර තියෙන්නෙ ඒවට විරුද්ධ සමාජ බලවේගයක් ගොඩනගන්න නෙවෙයද?"

"එහෙම බලවේගයක් ගොඩනැගෙන්න අවශ්‍ය වාස්තවික තත්ව නිර්මාණය වුණාම ඒක බිහිවෙයි.. එහෙම නැතුව උඹටවත් මටවත් ඕනෑ වුණ පමණින් බලහත්කාරයෙන් එහෙම බලවේග ගොඩනගන්න බැහැ විදුල.."

"ඒකත් හොඳයි.. එලුවගෙ අර මොකක්ද එක කඩා වැටෙනකල් බලාඉන්න එක පහසුයිනෙ.."

විදුල ජයන්ත ගේ අතට යටවී තිබූ තිරනාටකය සහිත ලිපිගොණුව තමා වෙතට ඇද ගත්තේ ය. ජයන්ත සිය සුරතින් ඔහු වළක්වන්නට තැත්කළේ ය.

"ඔහොම හිටපං... මං තාම මේක හරියට කියෙව්වෙ නෑ.. අද රෑ කියවලා හෙට මගේ අදහස කියන්නං.." ඔහු කීවේ ය.

"ඒක අවශ්‍ය වෙන එකක් නැහැ... ආයෙ සැරයක් කියෙව්වත් උඹේ දැක්ම වෙනස් කරන්න මේ ස්ක්‍රිප්ට් එකට බැහැනෙ.. මේ අකුරු අස්සෙ මැජික් නැහැනෙ.. මං යන්නං.." විදුල නැගී සිටන අතර කීවේ ය.







සිය කාර්යාලයෙන් පිටවී පඩි පෙළ බැස යන විදුල දෙස ජයන්ත බලා සිටියේ ය. විදුල වීදියේ සෙනග අතරේ නොපෙනී ගිය පසු සිය ජංගම දුරකතනය අතට ගත් ඔහු අංක කීපයක් ඔබා එය කන තබා ගත්තේ ය.

"ඔන්න විදුලයා මෙදා පාර උඹලගේ පැණි හැලියට ගලක් ගහන්න හදනවා.." ඔහු අනෙත් පසින් දුරකතනයට සම්බන්ධ වූ තැනැත්තාට කීවේ මහ හඬින් සිනාසෙමින් ය. " විදුල දන්නැද්ද බං.. විදුල මුණසිංහ.. පෙරළිකාර සිනමා අධ්‍යක්ෂවරයා.. මං ස්ක්‍රිප්ට් එක කියෙව්වා.. හැබැයි පුතෝ ඔය ෆිල්ම් එක හැදුනොත් නං උඹලගෙ පැණියන්ට හැංගෙන්ඩ තැන් හොයාගන්ඩ වෙයි.."

**මතු සම්බන්ධයි**




# Youth

*What is it you search for?*
*Only the youth fountain and no more*
*Youth can't be found in the furthest of lands*
*Because you already have it in your hands*
*Live everyday so you have nothing to regret*
*And this youth fountain you search for you will forget*
*You friends by your side*
*Make sure you leave nothing behind*
*You can discover something new*
*Only seen by a few*
*When you look back at this day*
*You can smile and say*
*I did not need a fountain to bring me youth*
*But I found it myself and that is the truth*

You know how people always say that being a teenager is the best part of your life and that we should enjoy every moment of our youth? There is no hurry to grow up so without running through every moment why don't we slow down our pace and enjoy everything around us. We will never get this time of our life back again. We make our closest friends now who may be around with us till the day we die, find hidden talents that could open more opportunities for us and most importantly this is the time of our lives that we make the best memories that we can look back at and laugh.

Childhood is when we start to make new friends, some that will stick with us for a little while or some that we might know for the rest of our lives. With social networking and the internet it is easier for us to make new friends. It is always important to never judge someone without getting to know them; you can't just look at someone and know what they are going to be like. You have to take your time to get to know someone. Friends are who make your childhood fun, they are who you can go to and talk to if you are upset and call for if you are in trouble and need help. They will always put a smile on your face and no amount of money can buy that.

Lots of people discover new skills in their youth. Some people discover their musical talent, while others may find their sporty side and some people may excel in a certain subject. Don't cross out anything and always keep your options open. Don't ever shut down any opportunities thrown your way, have a go at everything and if you fail at least you tired, it's better to fail knowing that you tried. Join up different clubs at school and you may find your hidden talent. You'll never know what you are good at until you try and it. Live everyday knowing that you won't get this moment again.

Enjoy this time in your life because when you grow up and you look back at all your memories you want to make sure that you do not regret anything. Do you want to remember your youth as you just sitting on a chair doing nothing all day? Discover something new every day, even if it is as little as a simple fact form the internet to discovering a new place that you have not heard of before. Make something out of each day, you have 24 hours that you will not get back in your whole lifetime; make the most of it.

I don't know what I want to do in my future but I always keep my options open. I have an amazing group of friends that are always there for me. We always have the best time when we get together and they always put a smile on my face and lift my spirits when I am feeling upset. Together we make the best of every day. To this day In have nothing to regret about the decisions that I have made.



We still have a long way to go but that distance will disappear in a blink of an eye. Whenever I'm looking forward to something I always make a countdown and everything, but the net thing I know the moments finish and I am looking forward for something else. Soon we will be adults and our youth will be lost, so stop making countdowns and enjoy every day. Treat your friends like gold because they will never rust and always be there. Discover hidden talents, even though this may take some digging what you find may open new doors for you. Create memories that will stay with you forever. We can't slow down time, or make it go back. Time only goes forward and if we do not make the best of our time right now the only thing that we can do in the future is look back at these moments and regret that we did not make the best of it.










